www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මධ්‍යම පන්තික "වම්මු" සහ යූ.ඒ.ඩබ්ලිව්.-ජී.එම්. ගිවිසුම

## The middle-class "left" and the UAW-GM contract

ජෙරී වයිට් සහ බැරී ග්‍රේ විසිනි
2007 ඔක්තෝබර් 12

යුනයිටඩ් ඔටෝ වර්කර්ස් (යූඒඩබ්ලිව්) සහ ජෙනරල් මෝටර්ස් (ජීඑම්) ගිවිසුම, යූඒඩබ්ලිව් වෘත්තීය සමිතියේ දශක ගනනාවක පරිහානියේ සංධිස්ථානයක් සනිටුහන් කරයි. මෙම ගිවිසුම ඇතිකර ගැනීමත් සමග යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය ඩොලර් බිලියන දසලක්ෂ ගනනක ආයෝජන අරමුදලත් සහිත ව්‍යාපාරයක් බවට පරිවර්තනය වෙයි. ඊට හිලව් වශයෙන්, කලින් ගෙවන ලද වැටුපෙන් අඩක් ගෙවනු ලබන සහ විශ්‍රාමික සැලැස්මක් නැති තරුන ශ්‍රම බලකායක් මගින් පැරනි කම්කරුවන්ව වේගයෙන් විස්ථාපනය කිරීමට, විශ්‍රාමිකයන් සඳහා හාම්පුතා විසින් ගෙවනු ලබන වෛද්‍ය ප්‍රතිලාභ අහෝසි කිරීමට ද මූර්ත වැටුප් පොදුවේ කප්පාදු කිරීමට සහ අඛන්ඩව කෙරෙන රැකියා විනාශ කිරීමට ද ජෙනලර් මෝටර්ස් සමාගමට එය සහයෝගය දෙයි.

රථවාහන කම්කරුවන්ගේ කලින් පරම්පරාවන් විසින් දිනා ගෙන ඇති සියලුම මූලික ජයග්‍රහන මෙම ගිවිසුම මගින් විනාශ කෙරයි.

ගිවිසුමෙහි හදවත වන්නේ විශ්‍රාමිකයන්ගේ සෞඛ්‍ය ප්‍රතිලාභ සඳහා වෘත්තීය සමිතිය විසින් පාලනය කරනු ලබන ඩොලර් බිලියන දශලක්ෂ ගනනක භාරකාර අරමුදලක් පිහිටුවීම ය. ඊනියා ස්වේච්ඡා සේවක ප්‍රතිලාභී සංගමය හෙවත් වෙබා, මගින් වෘත්තීය සමිති ලාභ උපයන ව්‍යාපාරයක් බවට සහ සමිති නිලධරය කම්කරුවන් සූරාකන පරිනත කොටස්කරුවන් බවට පරිවර්තනය කෙරෙනු ඇත. විශ්‍රාමික වෘත්තීය සමිති සාමාජිකයන්ගේ ප්‍රතිලාභ බරපතල ලෙස කප්පාදු කෙරෙන මොහොතේ දී ම ජෙනරල් මෝටර්ස් සමාගමේ කොටස් හිමිකමත් ඇතුලුව එහි ආදායම සහතික කෙරෙන දැවැන්ත මුදල් කන්දරාවක් යූඒඩබ්ලිව් නිලධරය අතට ලැබෙනු ඇත.

යූඒඩබ්ලිව් විවෘත ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීම හදිසි හෝ බලාපොරොත්තු රහිත වර්ධනයක් නොවේ. සමාජවාදී සමානතා පක්ෂය සහ එහි පෙරගමන්කරු වර්කර්ස් ලීගය දශක ගනනාවක් මෙම සංතතිය විශ්ලේෂනය කරමින් සිටී. යූඒඩබ්ලිව් සහ ඒඑෆ්එල් - සීඅයිඕ කම්කරු පන්ති සංවිධාන ලෙස නිර්වචනය කිරීම "ඔවුන් මුහුන දෙන ප්‍රශ්නවල යථාර්ථය කෙරෙහි කම්කරුවන්ව අන්ධ කිරීමත්" බව 1992 තරම් ඈත දී අපි පැහැදිලි කලෙමු.

යූඒඩබ්ලිව් පරිවර්තනය හුදෙක් දූෂිත නායකත්වයන්ගේ ආත්මීය ස්වභාවයේ හෝ නොමග ගිය පිලිවෙත්වල නිෂ්පාදිතයක් නොව, වෘත්තීය සමිති සංවිධානවල ස්වභාවය තුල මුල් බැසගත් මූලික වෛශයික සන්තතතියේ ප්‍රකාශනය සහ ලෝක ධනවාදී ව්‍යුහය තුල සිදු වූ ප්‍රධාන වෙනස්කම්වල බලපෑම නිසා බව කරුනු දෙකක් මගින් පෙන්නුම් කෙරෙයි. පලමු වැන්න, දීර්ඝ කාලපරිච්ඡේදයක් පුරා, මේ වන විට දශකයකට වැඩි කාලයක්, කම්කරුවන්ගේ අරගල යටපත් කිරීමට සහ දැවැන්ත ලෙස රැකියාවලින් දොට්ට දැමීම ඇතුලුව කම්කරුවන්ගේ වැටුප් සහ ප්‍රතිලාභ කප්පාදු කිරීමට වෘත්තීය සමිති විවෘතව කටයුතු කර තිබේ.

පසුගිය මාසයේ දෙදින වර්ජනය ඇමරිකානු රථවාහන කම්කරුවන්ගේ සේවා කොන්දේසි සහ ජීවන තත්වයන්හි විනාශ කාරී පහත වැටීමක් අත් දුටු- යූඒඩබ්ලිව් ජීවිත කාලයෙන් අඩකට වැඩි කාලයක් වූ වසර 37 පසුව විශාලතම ඇමරිකානු රථවාහන නිෂ්පාදන සමාගමේ සිදුවූ ප්‍රථම ජාතික වර්ජනය වීය.

වෘත්තීය සමිතිවල පරිහානියේ සහ පරිවර්තනයේ ජාත්‍යන්තර පරිමාව දෙවැනි කාරනය යි. මෙය ඇමරිකානු ප්‍රපංචයක් නොව, උතුරු ඇමරිකාව, යුරෝපය, සහ ආසියාවේ වර්ධිත ධනවාදී මධ්‍යස්ථාන මෙන්ම ඊනියා අඩුදියුනු රටවල් අලලාගත් ලෝක ප්‍රපංචයකි. ඇමරිකානු යූඒඩබ්ලිව් සහ ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානයන්ගේ සිට බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති කොංග්‍රසය, දකනු අප්‍රිකානු වෘත්තීය සමිති කොංග්‍රසය, ජර්මන් වෘත්තීය සමිති සම්මේලනය, ඕස්ට්‍රේලියානු වෘත්තීය සමිති කවුන්සිලය දක්වා සියලුම වෘත්තීය සමිති ශ්‍රමය කලමනාකරනය කිරීමේ සංගතවාදී පිලිවෙතේ "කොටස්කාරිත්වය" පිලිගනිමින් ඔවුන්ගේ සාමාජිකයන්ගේ රැකියා, වැටුප් සහ සේවා කොන්දේසිවල වියදමින් ශ්‍රම පිරිවැය පහත හෙලීමට කටයුතු කර තිබේ.

මෙම විශ්වීය සන්තතියට පිටුපසින් පවතින ගාමක බලය වන්නේ ශ්‍රම වෙලඳපොලත් ඇතුලුව ජාතික වෙලඳපොලට ඉහත දී පැවැති ප්‍රමුඛතාවය

අහෝසි වී තිබීම සහ ශ්‍රම බලකායේ වඩාත්ම ලාභ මූලාශ්‍රයන් සඳහා පෘථිවිය සිසාරා යාමට අන්තර්ජාතික සංගතවලට ඇති හැකියාව ය. මෙම තතු තුල ඒවායේ ඓතිහාසික සම්භවය සහ ජාතික වෙලඳපොලට සහ ජාතික රාජ්‍යය කෙරෙහි පන්ති සහයෝගිතාවාදී වීමේ ප්‍රවනතාවයන් හේතු කොට ගෙන වෘත්තීය සමිති බාධාකාරී සහ බලරහිත සංවිධාන බවට පරිවර්තනය වී ඇත. භූගෝලීකරනයේ බලපෑම යටතේ කම්කරු පන්තිය සඳහා සහන ලබා ගැනීමට පාලක ප්‍රභූවට සහ රාජ්‍යයට පීඩනය යොදන සංවිධානවල සිට හාම්පුතුන්ට සහන ලබා දීම සඳහා කම්කරුවන් මත පීඩනය යොදන සංවිධාන බවට, වෘත්තීය සමිති පරිවර්තනය වී තිබේ. ඔවුන් එසේ කරන්නේ, "ඔවුන්ගේ" සමාගම් පොලඹවාලීම සඳහා සහ ඒ අනුව වෘත්තීය සමිති සාමාජිකත්වය පහත වැටීම සහ එහි ප්‍රතිවිපාකයන් ලෙස නිලධරයේ ආදායම අඩුවීම වලක්වාගැනීමට ය.

## 1980 - පාවාදීම්වල දශකයක්

1981 පැට්කො ගුවන් ගමන් පාලකයන්ගේ වර්ජනය කුඩු කර දැමීමට ඒඑෆ්එල් - සීඅයිඕ නායකත්වය රේගන් පරිපාලනයට සහයෝගය දීමෙන් ඉක්බිතිව යූඒඩබ්ලිව් සභාපති ඩග්ලස් ෆ්‍රේසර් ක්‍රයිස්ලර් සමාගමේ අධ්‍යක්ෂ මන්ඩලයට ඇතුලුවෙමින් සමාගම අර්බුදයෙන් ගොඩ ගැනීම සඳහා රථවාහන කම්කරුවන් මත කප්පාදු කිරීම් පැටවීම ආරම්භ කෙරුන 1980 දශකය වෘත්තීය සමිතිවල පරිවර්තනයේ ප්‍රධාන කඩඉමකි.

ඇමරිකානු පාලක ප්‍රභූව දශක හතරක් තුල ක්‍රියාවට නොදැමූ වර්ජන කඩාකප්පල් කිරීමේ ක්‍රමවේද යලි පනගැන්වීම, වෘත්තීය සමිති මර්දනය, නෛතික නඩු පැවරීම් සහ පිකට් උද්ඝෝෂනයන්හි යෙදෙන්නන් ත්‍රස්ත කිරීමේ ප්‍රචන්ඩ ප්‍රහාරයක් කම්කරු පන්තියට විරුද්ධව මුදාහලේ ය. වැටුප් කප්පාදු කිරීම්, වැඩපලවල් වසාදැමීම සහ කම්කරුවන් රැකියාවලින් දොට්ට දැමීම පිලිගැනීමට බලකිරීම සඳහා යූඒඩබ්ලිව් සහ ඒඑෆ්එල්-සීඅයිඕ නායකත්වය හිතාමතා ම සෑම ආර්ථික අංශයකම කම්කරුවන්ගේ කටුක අරගල රාසියක් හුදකලා කර පාවාදුන්හ.

අපගේ ව්‍යාපාරය 1993 නිකුත් කල *ධනවාදී නිෂ්පාදනයේ භූගෝලීයකරනය සහ ජාත්‍යන්තර කම්කරු පන්තියේ කර්තව්‍යයෝ* නමැති ලියවිල්ලක් තුල දී ඔවුන්ගේ පරිවර්තනය නිර්වචනය කෙරෙන නිලධරයේ දේශපාලනික භූමිකාව සහ මෙම සංවිධානවල අභ්‍යන්තර සංතතිය විශ්ලේෂනය කරමින් ඇමරිකානු වෘත්තිය සමිතිවල ශේෂ පත්‍රයක් සැකසීය.

## එම ලියවිල්ලෙන් උපුටා දැක්වීම

"ඒඑෆ්එල් සීඅයිඕ සංවිධානයේ දීර්ඝ කාලීන පරිහානිය තුල දී, වරප්‍රසාදිත සුලුධනේශ්වර සමාජ ස්තරයක් වන්නාවූ, නිලධරය කම්කරු පන්තියේ උවමනාවන්ගෙන් ස්වකීය උවමනාවන් විභේදනය කොට වියෝජනය කරගෙන තිබේ.වර්තමාන ඒඑෆ්එල්-සීඅයි සංවිධානය නියෝජනය කරන්නේ 1930 ගනන්වල කාර්මික වෘත්තීය සමිති පිහිටුවීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කල සියලුම සමාජවාදී සහ රැඩිකලීකරනයවූ කම්කරුවන් ක්‍රමනුකුලව විරේක කිරීම ඇතුලුව දීර්ඝ සංතතියක නිශ්චිත ප්‍රතිඵලය යි.

1980 ගනන්වල වෘත්තීය සමිතිවිසින් කල අඛන්ඩ පාවාදීම්මාලාව, ඇමරිකානු ධනවාදයේ ලෝක තත්වය පහත වැටීම, එක්සත් ජනපද කර්මාන්තවලට පිටරටවලින් විශේෂයෙන්ම ජර්මනියෙන් සහ ජපානයෙන් එල්ල වූ තීව්‍ර වන අභියෝගය, සහ ඇමරිකානු කම්කරු පන්තිය විනයගත කිරීමේ ඇමරිකානු ධනවාදයේ අවශ්‍යතාවයට නිලධධාරි තන්ත්‍රයේ ප්‍රතිචාරය බව ලියවිල්ල පැහැදිලි කලේ ය.

"මෙහි ප්‍රතිඵලයක් ලෙස නිලධරයේ ක්‍රියාවන්හි ඉලක්කය වූයේ කම්කරු පන්තිය සූරාකෑම අවම කිරීම නොව, ඒ වෙනුවට එය තීව්‍ර කිරීම" බව එය පැහැදිලිව ප්‍රකාශ කලේ ය.

1980 ගනන්වල කම්කරු පන්තියේ කටුක අරගල පාවාදීමේ සහ පරාජයට ඇද හෙලීමේ " අපේක්ෂිත අරමුන වූයේ කම්කරු පන්තියේ විශාල කොටසක සටන්කාමීත්වයට යටිවල කැපීම සහ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා සෑම ප්‍රධාන වෘත්තීය සමිතියක් තුල ම සංගතවාදී ශ්‍රම කලමනාකරන ව්‍යූහයන් ස්ථාපිත කිරීමේ කොන්දේසි සැකසීම ය."

මෙම පදනම මත නිලධරය, එහි සාමාජිකත්වය සහ සමාජ පදනම පටුවීම ඇතුලුව එහිම ද්‍රෝහී පිලිවෙත්වල ප්‍රතිවිපාකවලින් එහි ආර්ථික සහ සමාජ උවමනාවන් රැක ගැනීමට උත්සාහ කලේ ය.

"ලාභ බෙදාගැනීමේ සැලසුම්, සංගත අධ්‍යක්ෂ මන්ඩලතුල නියෝජනය, 'කම්කරු කොටස් මිලදී ගැනීම්', සහ සේවක කොටස් හිමිකම් සැලසුම්, වෘත්තීය සමිති කලමනාකරන අරමුදල්, සහ ව්‍යාපාරික සමපේක්ෂන සහ අනෙකුත් උපායන්ගේ රූපාකාරයෙන් සමිති නිලධරය හාම්පුතුන්ගේ සහ ආයෝජන බැංකුකරුවන් සමග නව මූල්‍ය සම්බන්ධතා තහවුරු කර ගත්තේ ය...

නිල වෘත්තීය සමිති නිලධරයෙන් සැදුම්ලත් අතිශයින්ම වරප්‍රසාදිත සුලු ධනේශ්වර ස්තරයක මෙම ආර්ථික සහ දේශපාලන පදනම් මූල්‍ය ආයෝජන සහ ධනපති රාජ්‍යයේ සෘජු සහනාධාර - මත රඳා පවතී. මෙම දූෂිත සංවිධානවලට 'කම්කරු සංවිධාන' වැනි නිර්වචනයන් යොදා ගැනීම සේවය කරන්නේ එහි සමාජ ස්වභාවය සහ මෙම සංවිධාන සහ කම්කරු පන්තිය අතර ගැඹුරුවෙමින් තිබෙන ප්‍රතිවිරෝධයන් සැඟැවීමට පමනි."

පසු වර්ධනයන් විසින් මෙම විශ්ලේෂනය තහවුරු කර ඇති අතර ජෙනරල් මෝටර්ස් සමාගම සමග යූඒඩබ්ලිව් මැතදී ඇති කරගත් ගිවිසුම මගින් එය මුලුමනින් ම සනාථ කර තිබේ. එක්සත් ජනපදයේ වෘත්තීය සමිති සාමාජිකත්වය 1950 දශකයේ මුල්භාගයේ පුද්ගලික අංශයේ ශ්‍රම බලකායෙන් සියයට 35 තරම් ඉහල මට්ටමක සිට සියයට 11 තරම් පහලට වැටීම 1993 ලියවිල්ල සටහන් කලේ ය. අද එම සංඛ්‍යාව සියයට 7.4කි. 1930 ගනන්වල එක්සත් ජනපදයේ කාර්මික වෘත්තීය සමිතිවල නැගීමට පෙර පැවති වෘත්තීය සමිතිගත වීමට වඩා සැලකිය යුතු පහල ප්‍රතිශතයකි. යූඒඩබ්ලිව් සාමාජිකත්වය 1978 දී දශලක්ෂ 1.5 සිට අද වන විට 520,000 දක්වා පහත වැටී තිබේ.

වර්ජන සංඛ්‍යාලේඛන වෘත්තීය සමිතිවල පරිවර්තනය පිලිබඳව තව දුරටත් සාක්ෂි සම්පාදනය කරයි. 1947 සිට 1980 දක්වා කම්කරුවන් 1000 හෝ ඊට වැඩියෙන් සම්බන්ධ වූ එක්සත් ජනපදය තුල වාර්ෂික අරගලවල සංඛ්‍යාව නිතරම 200ට වැඩි විය. 1980 දශකයේ ආරම්භයත් සමග එම සංඛ්‍යාව 50 වඩා පහත වැටුනි. පසුගිය වසරේ එබඳු අරගලවල සංඛ්‍යාව 20 පමනි.

එසේ වුවද, යූඒඩබ්ලිව් සාමාජිකත්වය පහත වැටීම තිබිය දී ම වර්ජන ආයුධය අතහැර දමා තිබීම නිසා මුලුමනින්ම පාහේ අත නොගැසූ ඩොලර් කෝටි ගනනක වර්ජන අරමුදලක පිටුබලය සහිතව, නිලධරය විසින් පාලනය කරන ලබන වත්කම් ඉහල යාම නොකඩවා සිදු විය. වෘත්තීය සමිතියට මහ මෝටර් රථ සමාගම් තුනේ සාමාජිකයන් 145,000 අහිමි වූ 2001-2005 අතර කාල පරිච්ඡේදය තුල යූඒඩබ්ලිව් මූල්‍ය වත්කම් ඩොලර් මිලියන 94කින් ඉහල නැගුනි. 2006 වසරේ අවසානයේ යූඒඩබ්ලිව්හි වාර්තාගත සමස්ථ වත්කම්වල වටිනාකම ඩොලර් බිලියන 1.23කි.

## යූඒඩබ්ලිව් සහ ඩිමොක්‍රැටික් පක්ෂය

යූඒඩබ්ලිව් සංවිධානය විසින් කම්කරු පන්තිය පාවා දීමේ හදවතෙහි ඇත්තේ එය සමාජවාදය ප්‍රතික්ෂේප කිරීම ය. ඩිමොක්‍රැටික් පක්ෂය සමග සංධානය සහ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයකට එහි ඇති විරුද්ධත්වය එය විසින් ධනවාදය ආරක්ෂා කිරීමේ දේශපාලන ප්‍රකාශනයයි. සමාජවාදී සමානතා පක්ෂය සහ එහි පෙරගමන්කරු වර්කර්ස් ලීගය ඩිමොක්‍රැටිකයන් සමග වෘත්තීය සමිති නිලධරයේ පවතින සංධානයට සහ එය විසින් ද්විපක්ෂ ක්‍රමය ආරක්ෂා කිරීමට ක්ෂමා විරහිතව විරුද්ධවී ඇති අතර සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම් වූ වැඩ කරන ජනයාගේ ස්වාධීන මහජන ව්‍යාපාරයක් සඳහා නිරන්තර අරගලයක යෙදී තිබේ.

මෙම ඉදිරි දර්ශනය සඳහා අරගලය තුල දී වෘත්තීය සමිති ග්‍රහනයෙන් මිදීමේ සහ වෘත්තීය සමිති සංවිධානවලින් ස්වාධීනව කම්කරු කොමිටි සහ ෆැක්ටරි තුල නව සංවිධාන රූප ගොඩ නැගිය යුතු බව විසිපස් වසරක් පුරා අපි කම්කරුවන්ට අවධාරනය කර ඇත්තෙමු.

මෙම යල්පිනූ සහ දූෂිත සංවිධානවලින් කැඩී වෙන් වීමට කම්කරුවන්ට අපගේ පක්ෂය කරන කැඳවුම අප කම්කරුවන්ට පිටුපස හරවන්නේ යයි අපට චෝදනා කරන විවිධ "වාම" සංවිධානවල - සමාජවාදී යැයි කියාගන්නා ඒවාත් ඇතුලුව - හෙලාදැකීම් ප්‍රකුපිත කර තිබේ. අපගේ "වාම" විරුද්ධවාදීන් ඒකාබද්ධ කරනු ලබන්නේ අවසර ලත් සහ යූඒඩබ්ලිව් සහ සෙසු වෘත්තීය සමිතිවල නිල නාලිකාවන් හරහා ගමන් කරන ඒවා හැර වෙනත් අරගල සංවිධානය කල නොහැකි බවට ඔවුන් කරන අවධාරනය මගිනි.

වර්කර්ස් වර්ල්ඩ් පක්ෂය, ඉන්ටර්නැෂනල් සෝෂලිස්ට් ඕගනයිසේෂන්, ස්පාටසිස්ට් ලීග් වැනි සංවිධාන යූඒඩබ්ලිව් - ජෙනරල් මෝටර්ස් ගිවිසුමට දක්වන ප්‍රතිචාරය, වෘත්තීය සමිති නිලධරයට ඔවුන්ගේ ඇති අවනතභාවය ඔවුන්ගේ අවස්ථාවාදී දේශපාලන ඉදිරිදර්ශනයන්ගේ සහ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ අත්‍යවශ්‍ය අංගයක් බව පෙන්නුම් කරයි.

වර්කර්ස් වර්ල්ඩ්, සෝෂලිස්ට් වර්කර් (ඉන්ටර් නැෂනල් සෝෂලිසිට් ඕගනයිසේෂන් ) වර්කර්ස් වැන්ගාඩ් (ස්පාටසිස්ට් ලීග්) සහ ලේබර් නෝට්ස් වැනි වෙබ් අඩවි සහ ප්‍රකාශන පිටු තුල ජෙනරල් මෝටර්ස් ගිවිසුම සම්බන්ධ ආවරනයන්වල දී මෙය පැහැදිලි ය.

ඔවුන්ගේ සියලුම ලිපි සම්බන්ධව සටහන් කල යුතු ප්‍රථම කරුන වන්නේ ගිවිසුම මගින් කරන ලද පාවාදීමේ ඓතිහාසික ස්වභාවය පිලිබඳ පොදුවේ සහ සුවිශේෂව යූඒඩබ්ලිව් සමිතිය සංගත ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීම ගැන කිසිදු බැරෑරුම් විශ්ලේෂනයක් නැතිකමය. මෙම සියලුම කන්ඩායම් ක්‍රියාකරන්නේ පසුගිය දශක තුනේ ඇමරිකානු කම්කරු ව්‍යාපාරය තුල කිසිදු අති මූලික වෙනසක් සිදුවී නැති ගානට ය. ඔවුන් මෙහෙය වන්නේ යූඒඩබ්ලිව් සමිතිය රථවාහන කම්කරුවන් විසින් පාලනය කරනු සහ කම්කරුවන්ගේ උවමනාකම් ප්‍රකාශකරන සංවිධානයක් යැයි සාවද්‍ය සහ ප්‍රතිගාමී උපකල්පනය මතය.

මෙය යූඒඩබ්ලිව් සංවිධානයේ දේශපාලනය ගැන පොදු නිහඬතාවයත් සමග අත්වැල් බැඳගෙන ඇත. ඩිමොක්‍රැටික් පක්ෂයට එය විසින් දෙනු ලබන දේශපාලන සහයෝගය ද එහි කයෝර ජාතිකවාදය ද ඇමරිකානු අධිරාජ්‍යවාදය සහ මිලිටරිවාදය ආරක්ෂා කිරීම සහ පෞද්ගලික අයිතිය සහ පෞද්ගලික

හිමිකරුවන් විසින් රථවාහන කර්මාන්තය පාලනය කරනු ලැබීමට එහි ඇති සහයෝගය සමග යූඒඩබ්ලිව් සංවිධානය කම්කරුවන් මතට කඩා පාත් කරනු ලබන ප්‍රහාර සමග කිසිඳු සාරභූත සම්බන්ධයක් නැතිවාක් මෙනි.

ගිවිසුම මගින් කර ඇති නිර්ලජ්ජිත පාවාදීම නිසා ගිවිසුම සහ යූඒඩබ්ලිව් නායකත්වයමත් සම්බන්ධව සමහර විවේචන කිරීමට මෙම කංඩායම්වලට බල කෙරී තිබේ. කෙසේ නමුත් මේවා ඉදිරිපත් කරන්නේ සුලු සුලු අඩුපාඩු හැටියට ය. එම අඩුපාඩු නැතිනම් යූඒඩබ්ලිව් සෞඛ්‍ය සම්පන්න සංවිධානයකි. නායකත්වය මත පීඩනය යෙදීම මගින් එම අඩුපාඩු මගහරවා ගත හැකි ය.

යූඒඩබ්ලිව් ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීම, ඔවුන්ගේම සාමාජිකත්වය සූරාකෑම මගින් ලාබ ලැබීම, මෙම සංවිධානවලට සමහර දුෂ්කරතාවයන් මතු කර ඇත. උදාහරන වශයෙන්, වෘත්තීය සමිතිය විසින් පාලනය කරනු ලබන අරමුදල් කොටස්වලට වෙලඳපොලේදී අපේක්ෂිත ලාබය නොලැබුනොත් හෝ ඉහල යන වෛද්‍ය වියදමට වඩා පහත වැටුනොත් යූඒඩබ්ලිව්, "එය නියෝජන කරනු ලබනවා යයි සිතන අයගේ ප්‍රතිලාබ කැපීමේ ලජ්ජා සහගත තැනකට" ඇද දමනු ඇතැයි *වර්කර්ස් වර්ල්ඩ්* කනස්සල්ල පලකරයි.

එම අදහස ම *වර්කර්ස් වැන්ගාඩ්* විසින් ද ප්‍රතිරාවය කරයි: "මෙම සැලැස්ම මගින් වෘත්තීය සමිතිය නය එකතු කරන්නෙකුගේ තත්වයට පත් කරනවා පමනක් නොව, උදාහරන වශයෙන්, ඉහල යන වෛද්‍ය වියදම සමග එහි ආයෝජනවලට පිය මැනීමට බැරි වුනොත් එය වෘත්තීය සමිතිය විසින් ම ප්‍රතිලාබ කප්පාදු කිරීමට ද දොර විවෘත කරනු ඇත."

මෙම වචන යූඒඩබ්ලිව් සංවිධානය පවත්වාගෙන යන ව්‍යාපාරික විධායකය කෙරෙහි නිසැකව සානුකම්පාවක් පෙන්නුම් කරයි. කම්කරුවන්ගේ ප්‍රතිලාබ කැපීම, අනෙකුත් ඕනෑම ප්‍රධාන විධායක නිලධාරින්ට මෙන් ම යූඒඩබ්ලිව් නිලධරයට තව දුරටත් "ලජ්ජාවට" කාරනයක් නො වේ. ඔවුන්ගේ සාමාජිකයන්ගේ වැටුප්, රැකියා, සහ සේවා කොන්දේසි කප්පාදු කිරීම සම්බන්ධයෙන් යූඒඩබ්ලිව් නිලධාරීන්ට දැනටමත් දශක ගනනාවක පලපුරුද්දක් තිබේ. වෙබා දේපල හිමියන් ලෙස, වෙලඳපොල ඉල්ලීම්වලට අනුව කැපිය යුත්තේ කවර ප්‍රතිලාබ දැයි ඔවුන් සහ ඔවුන්ගේ වෝල් ස්ට්‍රීට් උපදේශකයන් නිර්දය ලෙස ගනන් බලනු ඇත.

ඩොලර් බිලියන 70 ක ආයෝජන අරමුදලක් ඔවුන්ගේ අතැතිව" ෆෝර්ඩ් සහ ක්‍රයිස්ලර් සමාගම් සමග ඒ හා සමාන ගිවිසුම් ඇති කර ගත්තොත්" යූඒඩබ්ලිව් සභාපති රොන් ගෙටෙල්ෆින්ගර් සහ සෙසු වෘත්තීය සමිති නිලධාරින් දශලක්ෂපතියන් වීමට නැගී සිටිනු ඇත. මෙම දැවැන්ත අරමුදල "ආයෝජන කංඩායම් අතර බලගතු බලපෑමක් ඇති කරන අතර මෙම ඒකාබද්ධවීමට අවශ්‍ය කවරෙකු හෝ ගෙටෙල්ෆින්ගර් සමග හමුවකට උද්ඝෝෂනය කරනු ඇත."යි ඔටෝමෝටිව් නිව්ස් වාර්තා කලේ ය.

එමෙන්ම, ජෙනරල් මෝටර්ස් කොටස් මගින් මූල්‍ය සම්පාදනය කරනු ලබන සත්කාර අරමුදල් පදාසයක් සමග සමාගම තුල එහි කොටස්වල වටිනාකම ඉහල දමා ගැනීම සඳහා තමන්ගේම සාමාජිකයන් සූරාකෑම තීව්‍ර කිරීමට පරිපාලනයට උපකාර කිරීම වෙනුවෙන් යූඒඩබ්ලිව් මූල්‍ය දිරිගැන්වීමක් ලබනු ඇත.

යූඒඩබ්ලිව් "වාම" ක්ෂමාලාපකයන්ට මේ කිසිවක් වැදගැම්මකට නැත. කම්කරුවන්ට වඩා නිලධරය සමග එහි අනන්‍යතාවයක් ඇති බව වර්කර්ස් වර්ල්ඩ් පක්ෂයට සැඟවිය නොහැකිය. ඔවුන් මෙසේ ලියයි: "රැකියාවල ආරක්ෂාව හෝ පිලිගත හැකි සෞඛ්‍ය පහසුකම්වල ආරක්ෂාව යන දෙකෙන් එකක් තෝරාගන්න යැයි වෘත්තීය සමිතියට කීම මොනතරම් අමානුෂිකද!"

## යූඒඩබ්ලිව් සහෝදරත්වයේ මිථ්‍යාව උත්කර්ශට නැංවීම

ගිවිසුම "ජෙනරල් මෝටර්ස් සමාගමට ඓතිහාසික යටත් වීමක්" බව ඉන්ටර්නැෂනල් සෝෂලිස්ට් ඕගනයිසේෂන් පිලිගන්නා නමුත් යූඒඩබ්ලිව් සංවිධානයේ ස්වභාවය පිලිබඳව කිසිඳු නිගමනයකට නොඑලඹෙයි. ඒ වෙනුවට එය කම්කරුවන්ට කියන්නේ වෘත්තීය සමිති නායකයන් ප්‍රතික්ෂේප කරමින් "සහෝදරත්වයේ හා සාමූහික ක්‍රියාකාරීත්වයේ යූඒඩබ්ලිව් සම්ප්‍රදාය" ආරක්ෂා කරන ලෙස ය.

පසුගිය දශක තුනේ මේ මිනිසුන් සිටියේ කොහි ද? පසුගිය වසර 30 පුරාම යූඒඩබ්ලිව් වැලඳගෙන ඇති එකම "සහෝදරත්වය" නම් රථවාහන සමාගම් ප්‍රධානීන් සමග ඇති සහෝදරත්වයයි. 1980 ගනන් මුල දී වෘත්තීය සමිතිය "ශ්‍රම කලමනාකරන පංගුකාරකම" එහි නිල පිලිවෙත බවට පත් කරගත් අතර එතැන් පටන් පන්ති විඥ්ඥානය සම්බන්ධ අතිමූලික රූපාකාරයන් බිඳ දැමීමට කල හැකි සෑම දෙයක් ම කලේ ය.

එහි කොඩිය වැනීමේ ජාතිකවාදය මගින් එක්සත් ජනපද කම්කරුවන් සහ ආසියාවේ, ලතින් ඇමරිකාවේ සහ යුරෝපයේ ඔවුන්ගේ සමපාර්ශවකරුවන් අතර කුඥ්ඥයක් ගැසීමට යූඒඩබ්ලිව් උත්සාහ කලේ ය. වෘත්තීය සමිතිය " තරගකාරී මෙහෙයුම් ගිවිසුම්" මගින් විවිධ ෆැක්ටරිවල කම්කරුවන් එකිනෙකාට එරෙහිව පිහිටුවා ඇත.

එකලස් කම්කරුවන් වැඩිහිටි සහ තරුන කම්කරුවන් වසයෙන් බෙදීමට එය ම කලේ ය.

මුල් කාල පරිච්ඡේද ගැන කීමට ඇත්තේ කුමක් ද? යූඒඩබ්ලිව් තවමත් ආරක්ෂක සංවිධානයක් ලෙස ක්‍රියාක්මක වෙද්දී පවා, එහි ආරම්භක දිනවල සිට ම එය දේශපාලනිකව ප්‍රතිගාමී භූමිකාවක් ඉටු කලේ ය. යූඒඩබ්ලිව් නායක වෝල්ටර් රොයිටර් ලේබර් පක්ෂයක් ගොඩනැගීමේ ඉල්ලීමට විරුද්ධවූ අතර ආර්ථික සහ දේශපාලන ජීවිතය මත සංගත ප්‍රභූවේ ආඥාදායකත්වයට කම්කරු පන්තියෙන් එල්ල විය හැකි කවර හෝ අභියෝගයක් වලක්වමින් වෘත්තීය සමිති ඩිමොක්‍රැටික් පක්ෂයට ගැට ගැසුවේ ය. 1940 සහ 1950 ගනන්වල දී රොයිටර් වෘත්තීය සමිති තුල සමාජවාදී සහ වාමාංශික කොටස් විරේක කර ධනපති ගැති, ඩිමොක්‍රැටික් පක්ෂයට ගැති සහ අධිරාජ්‍ය ගැති සංවිධානයක් ලෙස යූඒඩබ්ලිව් තහවුරු කලේ ය.

එහි කාලකන්නි වාර්තාව නිසා සංගත කලමනාකරනයේ පෘථුල කිරීමක් ලෙස නිවැරදිව එය දකින මහ වැඩපොලවල් තුනේ සහ ඉන් පිටත කම්කරුවන්ගේ ඇස් ඉදිරිපිට යූඒඩබ්ලිව් අපකීර්තියට පත් විය. එක්සත් ජනපදයේ දකුනු ප්‍රාන්තවල හොන්ඩා, ටොයොටා, සහ සෙසු ජපාන සහ යුරෝපීය කම්හල් සංවිධානය කිරීමේ වෘත්තීය සමිතියේ උත්සාහය එක් පරාජයකින් පසු තවත් පරාජයකට මුහුන දුන්නේ ය.

කෙසේ නමුත්, වෘත්තීය සමිති රහිත සමාගමක සංවිධානාත්මක ජයග්‍රහනයක් ප්‍රගතිශීලී වර්ධනයක් වන බව ඇඟවුම් කරමින් *වර්කර්ස් වැන්ගාඩ්* යූඒඩබ්ලිව් වෙනුවෙන් ඔට්ටු අල්ලයි. එය මෙසේ ලියයි. " අසංවිධානාත්මක කම්කරුවන් සංවිධානය කිරීම යූඒඩබ්ලිව් සංවිධානයේ ම පැවැත්ම සඳහා තීරනාත්මක ය. ජෙනරල් මෝටර්ස් ප්‍රධානීන්ට එරෙහි ජයග්‍රහනයක් විශාල සහ වර්ධනය වන වෘත්තීය සමිති ගත නොවූ කම්කරුවන් සංඛ්‍යාව, ප්‍රධාන වශයෙන්ම එක්සත් ජනපදයේ තිබෙන විදේශීය සමාගම් තුල සංවිධානය වීමේ උනන්දුව දල්වනු ඇත."

යූඒඩබ්ලිව් ඔවුන්ගේ වැඩපලවලට ආවොත් ඔවුන්ව එලවා දැමීමට ඡන්දය පාවිච්චි කරන ලෙස සමාජවාදී සමානතා පක්ෂය කම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. යූඒඩබ්ලිව් සංවිධානයට බැඳීමෙන් කම්කරුවන්ගේ තත්වය දශමයකින්වත් වර්ධනය නොවනු ඇත. ඊට විපරීතව යූඒඩබ්ලිව් ක්‍රියා කරනු ඇත්තේ කම්කරුවන් අතර සහෝදරත්වය සහ සංගත කෙරෙහි විරුද්ධත්වය බිඳීම සඳහා එයට හැකි සෑම දෙයක්ම කරමින් පාලනාධිකාරයේ පොලිස් කාරයකු ලෙස ක්‍රියා කිරීමය.

මහා සමාගම් තුනට අනාගතයේ බැඳෙන කම්කරුවන්ගේ පැයක වැටුප ඩොලර් 14 දක්වා අඩු කිරීමට, එනම් "භාන්ඩ නිෂ්පාදන කර්මාන්තයේ" සමිති ගත නොවූ කම්කරුවකුගේ සාමාන්‍ය වැටුප වූ ඩොලර් 19.62 වඩා අඩු වැටුපකට යූඒඩබ්ලිව් එකඟ වීමත් සමග සංවිධානගත වූ සහ නොවූ කම්කරුවන්ගේ වැටුප් අතර මෙතෙක් පැවති වෙනස - අතීත අරගලවලින් ලත් ජයග්‍රහනවල ඉතුරු පහදු ලෙස - මුලුමනින් අතුරුදහන් වනු ඇත.

අවසාන වශයෙන් සඳහන් කිරීමට වටින සංවිධානය ලේබර් නෝට්ස් කංඩායම ය. ඉන්ටර් නැෂනල් සෝෂලිස්ට් ප්‍රවනතාවයේ හිටපු සාමාජිකයන් විසින් 1979 දී පිහිටුවන ලද ලේබර් නෝට්ස් සංවිධානයේ නායකයෝ සමාජවාදී විඥානය සහ මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකෙන් කම්කරු පන්තිය ස්වාධීන කර ගැනීමේ අරගලය පැහැදිලිව ම ප්‍රතික්ෂේප කලහ. ඒ වෙනුවට කම්කරු පන්තිය සඳහා ඉදිරි මාවත සාමාජිකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ වෘත්තීය සමිති සටන්කාමීත්වය බව ප්‍රකාශ කරමින් ප්‍රජාතන්ත්‍රවාදී සංගමයක් සඳහා වූ ටීම්ස්ටර්වරු, යූඒඩබ්ලිව් තුල නිව් ඩිරෙක්ෂන් කංඩායම සහ වෘත්තීය සමිති ප්‍රතිසංස්කරනය කිරීම සඳහා උත්සාහ කල සෙසු කන්ඩායම් උනන්දු කලහ.

ගිවිසුම විවේචනය කල නිව් ඩිරෙක්ෂන් කල්ලියේ ආරම්භකයා වූ ජෙරී ටකර් ඇතුලු යූඒඩබ්ලිව් විධායක මංඩලයේ හිටපු සාමාජිකයන් තිදෙනෙකුගේ ප්‍රකාශයට ලේබර් නෝට්ස් නවතම මුද්‍රනය තුල විශේෂ ස්ථානයක් ලබා දී තිබුනි. ලිපිය නිමා කොට තිබුනේ "වෙබා වැරැද්ද සහ අනුමැති අපේක්ෂිත ගිවිසුමේ දැනට පවතින අසාධාරන කප්පාදු කිරීම් ගැන යලි සාකච්ඡාවලට එලඹෙන තුරු කම්කරුවන්ට වැඩ කිරීමට උපදෙස් දෙන" ලෙස යූඒඩබ්ලිව් නායකත්වයට "ගෞරවපූර්වකව" ආයාචනය කරමිනි. මෙම ආයාචනයේ නියාලු බව පසෙකින් තැබුවත් වෙබා සැලැස්ම සහ අනෙකුත් කප්පාදු කිරීම් "අත්වැරදීම්" නොව, නිලධරයේ උවමනාවන් ආරක්ෂා කිරීම සඳහා යූඒඩබ්ලිව් නිලධරය දැඩිව සටන් කල දැනුවත් පිලිවෙතකි.

## ඩිමොක්‍රටිකයන් සඳහා කවරයක් සම්පාදනය කිරීම

මිචිගන් කොංග්‍රස් සභික ජෝන් ඩිංගල් විසින් හඳුන්වාදුන් එක ගෙවුම්කරුවකු සහිත බිලක් ඇතුලත් ජාතික සෞඛ්‍ය පිලිවෙතක් සම්බන්ධ ක්‍රමයක් තහවුරු කිරීමට ඩිමොක්‍රැටික් පක්ෂයත් සමග වැඩ කිරීම යූඒඩබ්ලිව් නායකත්වයේ ප්‍රධාන කාර්ය භාරය බව ටකර් සහ සෙසු අය උපුටා දක්වමින් ලේබර් නෝට්ස් වාද කරයි. මිල ඇමුනුම් ඩොලර් ට්‍රිලියනයකට ආසන්නවූ යුද්ධයක් පවත්වාගෙන යාමට සම්බන්ධ වී සිටින සංගත-පාලිත පක්ෂයක් වන ඩිමොක්‍රැටික් පක්ෂය වැඩ කරන ජනයා සඳහා ජාතික සෞඛ්‍ය ක්‍රමයක් නිර්මානය කරනු ඇතැයි යන මතය තුච්ඡ වංචාවකි. එවන් කවර හෝ සෞඛ්‍ය පහසුකම් පිලිබඳ

"ප්‍රතිසංස්කරනයක්" ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රධාන ජනාධිපති අපේක්ෂිකාව, හිලරි ක්ලින්ටන්ට අරමුදල් සපයන මහා ව්‍යාපාරිකයන් සහ රක්ෂන සමාගම්වල උවමනාවන්ට මනාව ගැලපෙනු ඇත.

විවිධාකාර වාම කන්ඩායම්වලින් අශික්ෂිත ම එක ඩිමොක්‍රැටික් පක්ෂයට ගැති ලේබර් නෝට්ස් කන්ඩායම විය හැකි නමුදු, ඔවුන් විවෘතව ප්‍රකාශයට පත් කරමින් සිටින්නේ දේශපාලන අවස්ථාවාදීන්ගේ සමස්ත සමාජ ස්තරයේ පරාවක්‍රය පමනි. මේවා ඩිමොක්‍රැටික් පක්ෂයේ ආධිපත්‍යයෙන් සහ ධනවාදී දේශපාලනයෙන් කම්කරුවන්ව බිඳ ගැනීමේ සටනක් මගින් කම්කරු පන්තියේ දේශපාලන විඥ්ඥානය ඉහල දැමීමට සටන් කරන සංවිධානයෝ නොවෙති. ඊට විපරීතව පවතින දේශපාලන පර්යාය තුල බලපෑම දිනාගැනීම සඳහා දරන ඔවුන්ගේ උත්සාහයේ දී කම්කරු නිලධරය මත යැපෙන සුලු-ධනේශ්වර සංවිධානයෝ ය.

මෙම සංවිධාන වෘත්තීය සමිතිවලට මෙතරම් ඇලීගැලී සිටීමට සහ ඔවුන්ගෙන් බිඳීමට ඇති අකැමැත්තට තවත් හේතුවක් තිබේ. පසුගිය දශක දෙක තුල ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් කම්කරු නිලධරය තුලට අන්තර් ග්‍රහනය වී සිටින මෙම "වාම" රැඩිකලුන්ගේ සංඛ්‍යාව සුලුපටු නො වේ. බොහෝ අවස්ථාවල දී සංවිධායකයන්, ප්‍රාදේශීය නිලධාරීන්, කාර්ය මන්ඩල සාමාජිකයන් වශයෙන් ඉහල වැටුප් බුක්ති විඳින අතර 1960 ගනන්වල ශිෂ්‍ය වාමවාදියෙකු වූ ඇන්ඩෘ ස්ටර්න් සේවා සේවක ජාත්‍යන්තර සංගමයේ සභාපතිය.

මොවුන් මෙම කම්කරු විරෝධී සංවිධානවල වාම විරුද්ධවාදීන් ලෙස නොව ඒවායෙහි පක්ෂවාදීන් ලෙස කථාකරමින් සුලුධනේශ්වර දෘෂ්ටිවාදය බෙදාහදා ගන්නා අතර කම්කරු නිලධරය ගැනමත් ඔවුන් දක්වන සැලකිල්ල පෙන්නුම් කරයි.

ජෙනරල් මෝටර්ස් සටන ගැන ලේබර් නෝට්ස් ලිපිය අවසන් කරන්නේ "මෙම ගිවිසුම අනුමත කිරීමට සාමාජිකයන් ඉච්ඡාවෙන් පෙලඹවීමට ප්‍රමානවත් බලයක් වෘත්තීය සමිතියට තිබේ ද යන ප්‍රශ්නය ඉතිරිව පවතින" බව කෙරෙහි සැලකිල්ල පෙන්නුම් කරන සටහනක් සහිතව ය.

අව්‍යාජ සමාජවාදීන්ගේ කර්තව්‍යය වන්නේ යූඒඩබ්ලිව් "පෙලඹුම් බලය" ඉහල නැංවීම නොව එය විනාශ කිරීම සහ ජාත්‍යන්තරවාදී සමාජවාදී ඉදිරි දර්ශනය මත පදනම් වූ බලගතු දේශපාලන විකල්පයක් ගොඩනැගීම ය. සමාජවාදී සමානතා පක්ෂ සහ ලෝක *සමාජවාදී වෙබ් අඩවිය* කැපවී සිටින කර්තව්‍යය එයයි.

© www.wsws.org